ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/11/01/23

## මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අද දින (2023.01.11) රක්ෂිත බන්ධනාගාරගත කර සිටින අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ රැඳවුම් තත්ත්වය පරික්ෂා කිරීම සඳහා කොළඹ රක්ෂිත බන්ධනාගාරය වෙත විශේෂ පරීක්ෂණ මෙහෙවරක් සිදු කරන ලදී. මෙම මෙහෙවර සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස් වෛද්‍ය නිමල් කරුණාසිරි මහතා, මානව හිමිකම් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (අධීක්ෂණ හා ඇගයුම්) නිහාල් චන්ද්‍රසිරි මහතා සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු සහභාගි විය. මෙහිදී අදාළ රැඳවියා රඳවා සිටි රැඳවුම් ස්ථානය වෙතම ගොස් ඔහුගේ රැඳවුම් තත්ත්වය පරික්ෂා කරන ලදි. රැඳවුම් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු පියවරයන් පිළිබඳව අදාල බන්ධනාගාර නිලධාරීන් දැනුවත් කරන ලදි. මෙම පරික්ෂා කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කරන වධහිංසා වැලැක්වීම ජාතික යාන්ත්‍රණයේ (National Preventive Mechanism-NPM) කොටසක් ලෙස සිදුකරන ලදි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 11 (ඇ) සහ 28. (2) වගන්ති ප්‍රකාර හිමි ඇති බලතල අනුව පූර්ව දැනුම් දීමකින් තොරව මෙවැනි හදිසි පරික්ෂා කිරීම සිදු කරනු ලැබේ.

මෙම පරික්ෂා කිරීමේදී රැඳවුම් තත්ත්වය වැඩි දියුණු කිරීමට බෙහෙවින් ආධාර වන්නාවූ රැඳවියන් වෙත ලබාදෙන්නා වූ ආහාර පිළිබඳ සහ එම ආහාරපාන පිළියෙල කළ ආකාරය පිළිබඳ කරුණු විමසා බලන ලදි. එම ආහාර සහ එම ආහාරපාන පිළියෙල කරන ආකාරය වැඩි දියුණු කිරීම සඳහා ගතයුතු පියවරයන් පිළිබඳව ද අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. මෙම පරීක්ෂණයේදී හඳුනාගත් කරුණු පිළිබඳ වැඩිදුර කරුණු විමසීම සඳහා ඉදිරියේ දී බන්ධනාගාර බලධාරීන් . ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කැඳවීමට නියමිතය.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.01.11